## සිකුරාදා

පළමුවන කියැවීම දානියෙල් 7 : 2–14

දානියෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"මනුෂ්‍ය පුත්‍රයා වැනි කෙනෙක් අහසේ වලාකුළු පිරිවරා අවුත් පෞරානිකයාණන් වෙත එළඹුණේය."**

දානියෙල් තමා දුටු ස්වප්නය මෙසේ වාර්තා කළේය. "රාත්‍රියේ මාගේ දර්ශනයේ දී ස්වර්ගයෙන් හමා ආ මාරුත සතරක් මහ මුහුද කලඹනවාත්, එකිනෙකාට වෙනස් වූ දැවැන්ත මෘගයන් සතර දෙනෙකු මුහුදෙන් නැගී එනවාත් මම දිටිමි. පළමු වන මෘගයා සිංහයෙකු වැනිය. ඌට රාජාලි පියාපත් තිබුණේය. මා බලා සිටියදී උගේ පියාපත් උදුරා දමා, පොළොවෙන් ඔසවා මනුෂ්‍යයෙකු මෙන් පාද දෙකකින් ඌ සිටවනු ලැබීය. මනුෂ්‍ය සිතක් ද ඌට දෙන ලද්දේය.

මා දුටු දෙවන මෘගයා වලසෙකු හා සමාන ය. ඌ එක ඇලයකින් කෙළින් වී සිටියේය. උගේ කටේ දත් අතරේ ඉළ ඇට තුනක් තිබුණේය. 'නැගිට බොහෝ මස් කන්නැ'යි ඌට කියන ලද්දේය.

ඉන්පසු තවත් මෘගයෙකු දිටිමි. ඌ දිවියෙකු වැනිය. පක්ෂි පියාපත් සතරක් උගේ පිටේ තිබුණේය. ඌට හිස් සතරක් ද තිබුණේය. ඌට බලය දෙන ලද්දේය. මාගේ රාත්‍රි දර්ශනවලින් මා දුටු සතර වන මෘගයා භයානක, රෞද්‍ර ඉතා ශක්තිමත් එකෙකි. ඌට විශාල යකඩ දත් තිබුණේය. ඌ ගොදුරු පොඩිකර කා ගිල දැම්මේය. ඉතිරි දේ උගේ පාදවලින් පැගුවේය. කලින් කී මෘගයන්ට වඩා ඌ වෙනස් ය. ඌ අං දසයක් තිබුණේය. ඒ අං දෙස මා බලා සිටියදී, ඒවා අතරේ තවත් කුඩා අඟක් හට ගත්තේය. එයට ඉඩ දෙන පිණිස පළමුවන අං තුනක් උදුරා දමනු ලැබීය. මේ අඟට මනුෂ්‍ය ඇස් වැනි ඇස් ද පුරසාරම් දොඩන කටක් ද තිබුණේය.

"මා බලා සිටියදී, සිංහාසන පිහිටුවනු ලදුව පෞරාණිකයාණෝ අසුන් ගත්හ. උන් වහන්සේගේ වස්ත්‍ර හිම මෙන් සුදුය. හිසකේ පිරිසිදු ලොම් මෙන් සුදු ය. උන් වහන්සේගේ සිංහාසනය ගිනි ජාලාවකි. එහි රෝද ඇවිළෙන ගිනි ය. ගිනිමය ගංගාවක් උන් වහන්සේ ඉදිරියෙන් ගලාගෙන ගියේය. ලක්ෂ සංඛ්‍යාත පිරිසක් උන් වහන්සේට උපස්ථාන කළහ. කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත පිරිසක් උන් වහන්සේ ඉදිරියේ සිටියහ. අධිකරණ සභාව අසුන් ගත්තාය. පොත් දිග අරින ලද්දේය.

එවිට අර අඟ කතා කරන ආඩම්බර වචන නිසා මම බලා සිටියෙමි. මා බලා සිටියදී සතරවන මෘගයා මරා, උගේ ශරීරය විනාශ කර ඇවිළෙණ ගින්නට දමනු ලැබීය. සෙසු මෘගයන්ගෙන් උන්ගේ ආණ්ඩු බලය පහ කරනු ලැබු නමුත්, සීමාසහිත කාලයක් උන්ට ජීවත් වන්නට ඉඩ දෙන ලදි.

තවදුරටත් බල බලා සිටියදී මම රාත්‍රි දර්ශන වලදී මෙසේ දිටිමි. මනුෂ්‍ය පුත්‍රයා වැනි කෙනෙක් අහසේ වලාකුළු පිරිවරා අවුත් පෞරාණිකයාණන් වෙත එළඹුණේය. උන් වහන්සේ පෞරාණිකයාණන් වෙත පමුණුවනු ලැබු සේක. සියලු ජනයන් ද ජාතීන් ද භාෂාවන් ද උන් වහන්සේට සේවය කරන පිණිස පාලන බලය ද ගෞරවය ද රාජ්‍යය ද උන් වහන්සේට දෙන ලද්දේය. උන් වහන්සේගේ පාලනය පහ නොවන සදාකාලික පාලනයක් ය. උන් වහන්සේගේ රාජ්‍යය කිසි කලෙක නැති නොවන්නේය."

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය (ද්විතීය සම්මත ග්‍රන්ථ) දානියෙල් 1: 53–59

**පිළිතුර : සදා ස්තුතියත් මහිමයත් සමිඳුන් හට වේවා!**

ගීය : කඳු සහ හෙල් සමිඳුන් පසසන්න. මහිමයත් සදා ස්තුතියත් එතුමන් හට පුදන්න.
මිහි පිට වැඩෙන සියල්ලෙනි, සමිඳුන් පසසන්න. මහිමයත් සදා ස්තුතියත් එතුමන් හට පුදන්න.

ජල උල්පතෙනි, සමිඳුන් පසසන්න. මහිමයත් ස්තුතියත් එතුමන් හට පුදන්න.

මුහුදු සහ ගංගාවෙනි, සමිඳුන් පසසන්න. මහිමයත් සදා ස්තුතියත් එතුමන් හට පුදන්න.

මුහුදු සතුනි, ජලජ සතුනි සමිඳුන් පසසන්න. මහිමයත් සදා ස්තුතියත් එතුමන් හට පුදන්න. අහස් පක්ෂියෙනි, සමිඳුන් පසසන්න. මහිමයත් සදා ස්තුතියත් එතුමන් හට පුදන්න. වන සතුනි, හීලෑ සතුනි, සමිඳුන් පසසන්න. මහිමයත් සදා ස්තුතියත් එතුමන් හට පුදන්න.

සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
"ඔබේ විමුක්තිය ළංවේගෙන එන බැවින්
නැඟී සිට හිස් ඔසවන්න."
ආලේලූයා!

සුවිශේෂය ලූක් 21: 29-33

ලූක්තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"ඔබ මේ දේ සිදුවනු දක්නා කල, දෙවියන් වහන්සේගේ රාජ්‍යය ළංවී ඇතැයි දැන ගන්න."**

තවද, ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට උපමාවක් වදාළ සේක. "අත්තික්කා ගස හෝ අන් කිසි ගසක් හෝ ගැන සිතන්න. ඒවා දලු ලන විට, එය දුටු හැටියේම ගිම්හානය දැන් ළංවී ඇතැයි ඔබ දන්නහුය. එලෙසම, මේ දේ සිදුවනු දක්නා කල, දෙවියන් වහන්සේගේ රාජ්‍යය ළංවී ඇතැයි දැන ගන්න.

ඇත්තෙන්ම මම ඔබට කියමි. මේ සියල්ල සිදුවන තුරු මේ පරම්පරාව පහව නොයන්නේය. අහසත්, පොළොවත් පහව යන්නේය. එහෙත් මාගේ කිසිඳු වචනයක් පහව නොයන්නේ ම ය."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.